## සහාය තාකෂණය යනු කුමක්ද?

සහාය තාක්ෂණය යනු ජනතාවට එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම් වෙනුවෙන් ප්‍රායෝගික විසඳුම් සපයා දෙන උපාය මාර්ගයක් හෝ ක්‍රමයකි.

සහාය තාක්ෂණය මගින් ජනතාවට පහත දෑ වෙනුවෙන් උපකාරී විය හැකියඃ

- ස්නානය කිරීම, ඇඳුම් පැළඳුම් ඇන්දවීම හා ආහාර ගැනීම සඳහා සහය වීමෙන් තමන්ගේ අදරැති අය රැක බලා ගැනීම,
- එහා මෙහා යෑම (චලයතාවය) ආරකෂා සහිත හා පහසු කිරීම.
- බඳුන් විවෘත කිරීමට හා ජල නල ඇරීම හා වැසීම
- පහසුවෙන් කම්පියුටර් භාවිතා කිරීම හා කියවීමට තිරය වඩා පැහැදිලිව දැක්වීම
- නිවසේදී පුද්ගලික අනතුරු හැඟවීමේ පද්ධති භාවිතයෙන් පුද්ගල ආරකෂාව සහතික කිරීම
- විනෝදාත්මක ක්‍රියාකාරකම් ඉතා පහසු කිරීම.
- සහ අප්‍රමාණ තවත් අදහස්



Acknowledgement of funding

hacc home and community care
A JOINT COMMONWEALTH AND STATE/TERRITORY PROGRAM PROVIDING FUNDING AND ASSISTANCE FOR AUSTRALIANS IN NEED

Queensland Government
Disability Services Queensland

Queensland Government
Queensland Health




LifeTec™
QUEENSLAND
towards easier living

**Brisbane**
Level One, Reading Newmarket
Cnr Newmarket & Enoggera Roads
PO Box 3241, Newmarket Qld 4051
Phone: 07 3552 9000 Facsimile: 07 3552 9088

**Townsville**
Shop G-3A, Domain Central, 103 Duckworth Street
PO Box 8280, Garbutt Qld 4814
Phone: 07 4759 5600 Facsimile: 07 4759 5688

දුරකථනඃ 1300 885 886 (අදාල දේශීය දුරකථන ගාස්තු වලට යටත්වේ)
Email: mail@lifetec.org.au
**www.lifetec.org.au**

Institute for Healthy Communities Australia Certification Pty Ltd
AS/NZS ISO 9001:2000
QUALITY CERTIFIED ORGANISATION

# LifeTec™
QUEENSLAND
towards easier living



# අප ගැන විස්තර

Sinhalese

ලයිෆ් ටෙක් ක්වීනස්ලෑන්ඩ් යනු පුද්ගලයන්ට තමුන්ගේ ජීවන තත්වය දියුණු කර ගැනීමට හා ස්වාධිනත්වය දිගටම පවත්වා ගැනීම සඳහා උපකාරි විය හැකි පුළුල් සහාය තාක්‍ෂණ පෙළක් පිළිබඳ තොරතුරු හා විශේෂඥ උපදෙස් සපයන ප්‍රධාන ආයතනයකි.

## දර්ශනය

ජනතාව ඔවුනට ස්වාධීනව ජීවත් වීමට හා ජීවන තත්වය දියුණු කර ගැනීමට උපකාරීවීම සඳහා වඩාත්ම යෝග්‍ය සහාය තාක්‍ෂණය තෝරා ගනිති.







## විස්තර

1,500 කට වඩා අංගයන් සතු ලයිෆ් ටෙක් නිව්මාර්කට් (Newmarket) ප්‍රදර්ශන මධ්‍යස්ථානය මහජනතාව වෙනුවෙන් සතියට දින හයක් විවෘතව පවතී. ජනප්‍රිය ඩොමේන් සෙන්ට්‍රල් (Domain Central) සංකීර්ණයෙහි පිහිටා ඇති නව ටවුන්ස්විල් මධ්‍යස්ථානය සතියේ දිනවල විවෘතව පවතින අතර එහි අංග 500කට වඩා ප්‍රදර්ශනය කෙරේ.

ලයිෆ් ටෙක් විමසීමේ දුරකථන මාර්ගය 1300 885 886 සතියට දින හයක් විවෘතය. අපට ඔබගේ ප්‍රශ්න සඳහා ප්‍රතිචාර දැක්වීමට, විකල්ප ඉදිරිපත් කිරීමට සහ ඊමේල්, ෆැක්ස් හෝ තැපැල් මගින් විස්තර දැන්විය හැකිය.

අපගේ වෙබ් අඩවිය තුළින් ලයිෆ් ටෙක් සම්පූර්ණ දත්ත සමුදාය සතු 6,000කට අධික සහාය තාක්‍ෂණ විසඳුම් සතියේ දින හත තුළම දවසේ පැය 24 පුරා නොමිළයේ විමර්ශනය සඳහා පවතී. සෞඛ්‍යය වෘත්තිකයන්ටද LifeTec.info: වඩාත් විස්තර සහිත හා විශේෂාංග පිරි දත්ත සමුදාය සඳහා දායක වීමට තීරණය කළ හැකිය.

## උපදෙස් ලබා දීම*

ලයිෆ් ටෙක් විසින් මහජනතාවට, සෞඛ්‍යය වෘත්තිකයන්ට හා ආයතනයන්ට උපදෙස් සපයනු ලැබේ.

අපගේ සෞඛ්‍යය වෘත්තිකයන් විසින් එහා මෙහා යෑම (චලනතාවය), කම්පියුටරයට ප්‍රවේශවීම, සන්නිවේදනය, පුද්ගලික රැකවරණය, විනෝදය, නිවාසවල වෙනස් කිරීම්, හා දෛනික ජීවිතයේ අනෙක් කටයුතු වෙනුවෙන් විශේෂ විසඳුම් සපයනු ලැබේ.

අපගේ ප්‍රදර්ශන මධ්‍යස්ථාන වලදී හෝ ප්‍රාන්තය පුරා පළාත්බද සේවය කොටසක් ලෙස අප විසින් උපදෙස් සපයනු ලැබේ. අප නැවත ඔබගේ ප්‍රදේශයට පැමිණෙන විට මුණ ගැසීම සඳහා කල්වේලා වෙන්කර ගැනීමට අප අමතන්න.

*අපගේ සමහර සේවාවන් සඳහා සුදුසුකම් සපුරා ලිය යුතු විය හැකි අතර සමහර උපදෙස් ගාස්තුවකට යටත් විය හැකිය. ඔබට ඇති විකල්ප පිළිබඳ සාකච්ඡා කිරීමට කරුණාකර අපව අමතන්න.









## අධ්‍යාපනය

ලයිෆ් ටෙක් ක්වීන්ස්ලන්තය පුරාම ප්‍රජා කණ්ඩායම් හා ප්‍රදර්ශන සඳහා සහාය තාක්‍ෂණය පිළිබඳ සාකච්ඡා, ප්‍රදර්ශන භාණ්ඩ, හා ප්‍රායෝගික නිරූපණය කිරීම් සපයනු ලැබේ. ලයිෆ් ටෙක් නිරතුරුව පාසල්, සෞඛ්‍ය සම්පන්නව වයස්ගත වන්නන්ගේ කණ්ඩායම්, ව්‍යාපාර සහ TAFE හා විශ්ව විද්‍යාල සිසුන් වෙනුවෙන් ඉදිරිපත් කිරීම් කරනු ලැබේ.

තවද අප විසින් ප්‍රායෝගික හා අන්තර ක්‍රියාකාරී වෘත්තීය සංවර්ධන වැඩමුළු පවත්වනු ලැබේ.

අපගේ වෙබ් අඩවිය තුළින් ඉදිරිපත් කිරීම් හා වැඩමුළු පිළිබඳ වර්තමාන කාල සටහන පිරික්සන්න:
www.lifetec.org.au.